පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ...............................................
........................................................................................

කාලය : පැය 03 යි.

## භූගෝල විද්‍යාව II

Education NCP - www.edncp.lk

**සැලකිය යුතුයි :**

❖ එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### භෞතික කොටස

01. (i) භෞම පරිසර පද්ධතියේ ප්‍රධාන උප පද්ධති නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවියේ හරස්කඩක් ඇඳ එහි පහත සඳහන් අසන්තති 03 නම් කරන්න.

(අ) ලේමන්

(ආ) ගුටෙන්බර්ග්

(ඉ) මොහොරොවිසික් (ලකුණු 03)

(iii) පෘථිවියේ කබොල සම්බන්ධයෙන් පහත සඳහන් අංශ යටතේ කෙටියෙන් විස්තර කරන්න.

(අ) ව්‍යුහය

(ආ) සංයුතිය

(ඉ) ක්‍රියාකාරිත්වය (ලකුණු 06)

(iv) පාෂාණ ඒවායේ උපත අනුව බෙදිය හැකි ප්‍රධාන කොටස් තුන නම් කර, උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 09)

02. (i) යමකම ක්‍රියාවලිය යන්න හඳුන්වන්න. (ලකුණු 02)


(ii) (අ) ලොව යමහල් ව්‍යාප්ත කලාප 3 ක් සපයා ඇති ලෝක ආකෘති සිතියමේ ලකුණු නම් කරන්න. (ලකුණු 03)

(ආ) යමහල් ක්‍රියාවලිය තැටි මායිම් ආශ්‍රිත ව ඇති වන්නේ කුමන හේතු නිසා දැයි දක්වන්න. (ලකුණු 03)

(iii) යමහල් ක්‍රියාවලිය ඇති වීම කෙරෙහි බලපාන සාධක 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) යමහල් ක්‍රියාවලිය ආශ්‍රිත නිෂ්ක්‍රාන්ත භූ රූප 03 ක් හා ආක්‍රාන්ත භූ රූප 03 ක් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**02 වන ප්‍රශ්නය සඳහා භාවිතා කරන්න.**




03. (i) (අ) වෙරළ හඳුන්වන්න. (ලකුණු 02)

(ආ) වෙරළ බෙදිය හැකි කොටස් රූප සටහනක් මඟින් නම් කර දක්වන්න. (ලකුණු 02)

(ii) වෙරළ භූ ලක්ෂණයේ කොරල්පරවලට විශේෂත්වයක් හිමි වන්නේ කවර හේතු නිසා දැ යි කරුණු 02 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) තරංග නිධිසාධිත භූ රූප 03ක් ලියා ඉන් දෙකක් නිර්මාණය වන ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. (i) ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ගෝලීය සාධක 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) (අ) හරිතාගාර ආවරණයට බලපාන වායු වර්ග 04 ක් දක්වන්න. (ලකුණු 02)

(ආ) හරිතාගාර ආවරණය ඇතිවීමට බලපාන සාධක 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ''එල්නිනෝ '' ඇතිවන ප්‍රදේශයක් නම් කර, එයින් දේශගුණයට ඇතිවන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) හරිතාගාර වායූන් වායුගෝලයට මුදාහැරීම අවම කිරීම සඳහා ගෙන ඇති පියවරවල් පහත අංශ යටතේ සාකච්ඡා කරන්න.

(අ) බලශක්ති

(ආ) කාර්මික

(ඉ) කෘෂිකාර්මික (ලකුණු 08)

Education NCP www.edncp.lk

## මානුෂ කොටස

05. (i) ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජන සංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධි 02 නම් කර, ඉන් දෙවන අවධියේ දී ජන සංඛ්‍යාව වේගවත් ව වර්ධනයට බලපා ඇති හේතු සාධක 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ලෝකයේ ජන ව්‍යාප්තිය ආශ්‍රිත ව උද්ගත වී ඇති ගැටලු 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ආසියාවේ ජන සංඛ්‍යාව විශාල ප්‍රමාණයක් දරිද්‍රතාවයෙන් පීඩා විඳිති. කරුණු 02 ක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) සංක්‍රමණ යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ගමන ආරම්භක ප්‍රදේශයට හා ගමනාන්ත ප්‍රදේශයට සිදුවන යහපත් හා අයහපත් බලපෑම් 02 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) ජන සංඛ්‍යාවේ වියපත් වීම යනු කුමක් දැ යි හඳුන්වා එම ගැටළුවට විසඳුම් වශයෙන් ඔබ යෝජනා කරන දෑ කෙටියෙන් දක්වන්න. (ලකුණු 06)

(iv) ලෝක ජන සංඛ්‍යාව ඇසුරෙන් ඉදිරිපත් කර ඇති ප්‍රාථමික හා ගායන පිරමීඩ අතර වෙනස උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. (i) නාගරීකරණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) නාගරීකරණයේ මෑත කාලීන ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ව පැන නැගී ඇති සමාජ හා පාරිසරික ගැටලු 03 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ව පැන නැගී ඇති ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩු ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

08. (i) ජනාවාසයක් ස්ථානගත විමට බලපාන සාධක 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ග්‍රාමීය ජනාවාස රටා පැතිර ඇති ආකාර 03 ක් කටු සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ලෝකයේ නගර වර්ධනයේ අවස්ථා හතර නම් කර, ඉන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ පුරාණ ගමක දැකිය හැකි ප්‍රධාන කොටස් 02 නම් කර, ඉන් එකක ජන විද්‍යාත්මක හා සමාජ ආර්ථික සාධක 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ...................................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .................................................
...................................................................................................................

කාලය : පැය 02 යි.

# භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි :**


❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

❖ නිවැරදි පිළිතුර තෝරා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

01. භූමියේ වර්ග කිලෝමීටර එකක (1 $km^2$) වී වගා බිමක් පරිමාණය 1 : 50 000 සිතියමක නිරූපණය කරනුයේ, වර්ග සෙන්ටිමීටර ($cm^2$)

(1) 1 කිනි. (2) 2 කිනි. (3) 4 කිනි.
(4) 8 කිනි. (5) 16 කිනි. (..............)

02.




A B C D

ඉහත දැක්වෙන රූප සටහනෙහි A සිට D දක්වා බෑවුම් සියල්ල නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) උත්තල බෑවුම, මද බෑවුම, අවතල බෑවුම, දළ බෑවුම
(2) මද බෑවුම, දළ බෑවුම, අවතල බෑවුම, උත්තල බෑවුම
(3) අවතල බෑවුම, මද බෑවුම, දළ බෑවුම, උත්තල බෑවුම
(4) උත්තල බෑවුම, මද බෑවුම, අවතල බෑවුම, දළ බෑවුම
(5) අවතල බෑවුම, උත්තල බෑවුම, මද බෑවුම, දළ බෑවුම (..............)

Education NCP - www.edncp.lk

03. 1 : 50 000 මෙට්‍රික් සිතියමක ඉහළ වට තීරුව, පහළ වට තීරුව හා ඇතුළු මායිම් තීරු තුළ ඇතුළත් එක් තොරතුරක් බැගින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සිතියම් වර්ගය, දිශාව, අක්ෂාංශ දේශාංශ වටිනාකම්

(2) සිතියම් වර්ගය, පත්‍ර නාමය, පත්‍ර අංකය

(3) දිශාව, පරිමාණය, මුද්‍රණය කළ වර්ෂය

(4) දිශාව, පරිමාණය, සූචකය

(5) අක්ෂාංශ දේශාංශ වටිනාකම්, ජාලක යොමු වටිනාකම්, සූචකය (..............)

04. ශ්‍රී ලංකා 1 : 50 000 මෙට්‍රික් සිතියම්වල දැක්වෙන භෞතික ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කඳුවැටිය, ගංගාව, වැව, වෙරළ

(2) ඉඳි කළ ප්‍රදේශ, වනාන්තර, මොහොර

(3) උල්පත, වාරි ඇළ, ගංගාව

(4) ගං දූගරය, මොහොර, බොක්ක

(5) නෙරුව, කපොල්ල, වැව් බැම්ම (..............)

05. තොරතුරු ඉදිරිපත් කිරීම අනුව ප්‍රධාන සිතියම් වර්ග දෙක වන්නේ,

(1) තේමා සිතියම්, භූ ලක්ෂණ සිතියම්

(2) විශේෂ සිතියම්, පොදු අරමුණු සිතියම්

(3) අංකිත සිතියම්, දෛශික සිතියම්

(4) මෙට්‍රික් සිතියම්, අඟලේ සිතියම්

(5) හස්තික සිතියම්, මුද්‍රිත සිතියම් (..............)

06. භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් කළ හැකි ප්‍රධාන ම කාර්යයන් තුන නිවැරදි ව පිළිවෙළින් දක්වන වරණය තෝරන්න.

(1) තොරතුරු රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය

(2) භූ අවකාශිය තොරතුරු ගබඩා කිරීම, දෘශ්‍යමාන ව දැක්වීම, විශ්ලේෂණය කිරීම

(3) දත්ත ලබාගැනීම, හැසිරවීම සහ සකස් කිරීම

(4) තොරතුරු එක් රැස් කිරීම, හැසිරවීම, ඉදිරිපත් කිරීම

(5) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කිරීම (..............)

07. දත්ත නිරූපණයේ දී සහ ප්‍රස්තාර සටහන් දැක්වීමේ දී සමාජීය දත්ත පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ජන සංඛ්‍යාව, පෝෂණය, පීඩනය

(2) ආගමන විගමන, සෞඛ්‍ය, කර්මාන්ත

(3) කෘෂිකර්මය, ආනයන අපනයන, ආගමන විගමන

(4) ජන සංඛ්‍යාව, පෝෂණය, ආගමන විගමන

(5) පෝෂණය, ආනයන අපනයන, දරිද්‍රතාවය

(..............)

Education NCP - www.ednc p.lk

08. යුගල දත්ත අර්ථාන්විත ව දැක්වීමටත්, සන්සන්දනාත්මක ව විශ්ලේෂණය කිරීමටත් යොදාගත හැකි ප්‍රස්තාර වර්ග දෙකකි.

(1) ද්විත්ව තීරු, සැසඳුම් සමූහ තීරු (2) ද්විත්ව තීරු, සංයුක්ත තීරු

(2) පිරමීඩ, සක් සටහන් (4) ද්විත්ව තීරු, පිරමීඩ

(5) පිරමීඩ, සංඛ්‍යාත බහු අශ්‍ර (..............)

09. මෙට්‍රික් සිතියමක මූලිකාංගයක් **නොවන්නේ**,

(1) දිශාව (2) පරිමාණය (3) සූචකය

(4) මාතෘකාව (5) සමෝච්ච රේඛා (..............)

10. භූගෝලීය තොරතුරු පද්ධතියක ප්‍රධාන සංරචක තුන වන්නේ,

(1) ගුවන් ඡායාරූප, අංකිත සිතියම්, පරිගණක පද්ධතිය

(2) අවකාශීය නොවන දත්ත, පරිගණක පද්ධතිය, චන්ද්‍රිකා ප්‍රතිබිම්භ

(3) දත්ත, පරිගණක පද්ධතිය, අංකිත සිතියම්

(4) අවකාශීය දත්ත, මෘදුකාංග, අංකිත සිතියම්

(5) අංකිත සිතියම්, දෘඩාංග, මෘදුකාංග (..............)

11. පද්ධති, බාහිර පරිසරය සමඟ පදාර්ථ සහ ශක්තීන් හුවමාරු කරගැනීමේ ස්වභාවය අනුව වර්ග කීපයකි. ඒ අතරින් ආවෘත පද්ධතියක් යනු,

(1) පද්ධතියේ සීමාවන් හරහා ද්‍රව්‍ය හෝ ශක්තීන් පැමිණීමක් හෝ පිටවීමක් සිදු නොවේ.

(2) පද්ධතියේ සීමාවන් හරහා ද්‍රව්‍ය හෝ ශක්තීන් පැමිණීමක් හෝ පිටවීමක් සිදු වේ.

(3) පද්ධතියේ සීමාවන් හරහා ද්‍රව්‍ය පමණක් පැමිණෙයි.

(4) පද්ධතියේ සීමාවන් හරහා ශක්තිය පමණක් පැමිණෙයි.

(5) පද්ධතියේ සීමාවන් හරහා ද්‍රව්‍ය, ශක්තිය සහ වස්තූන් ද පැමිණෙයි. (..............)

12. වායුගෝලයේ අඩංගු වායුන් වර්ග පරිමාව අනුව ආරෝහණ පිළිවෙළට දැක් වූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) නයිට්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන්, ආගන් (2) නයිට්‍රජන්, ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ්, ආගන්

(3) නයිට්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්, ආගන්, ඔක්සිජන් (4) නයිට්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන්, ඕසෝන්

(5) නයිට්‍රජන්, ඔක්සිජන්, ආගන්, කාබන්ඩයොක්සයිඩ්

(..............)

13. උච්චත්වය සමඟ උෂ්ණත්වය වැඩිවන වායුගෝලීය ස්ථර දෙක වන්නේ,

(1) අපරිවර්තී ගෝලය, තාප ගෝලය (2) පරිවර්තී ගෝලය, අපරිවර්තී ගෝලය

(3) අපරිවර්තී ගෝලය, මෙසෝ ගෝලය (4) පරිවර්තී ගෝලය, මෙසෝ ගෝලය

(5) පරිවර්තී ගෝලය, තාප ගෝලය (..............)

Education NCP - www.edncp.lk

14. උත්පාටනය නම් බාදන ක්‍රියාවලිය සිදුවන්නේ කුමන නග්නීකරණ කාරකයක් ආශ්‍රිතව ද?

(1) ගලන ජලය (2) භූගත ජලය (3) සුළං

(4) සාගර තරංග (5) ග්ලැසියර් (..............)

15. ගංගාවක වෘධ අවස්ථාවේ නිර්මාණය වන භූ රූප ඇතුළත් වරණය තෝරන්න.

(1) දියලු අවාන්, හැඩපළු ගංගා, ගං දෑගර, පුලුල් නිම්න

(2) ගං දෑගර, ගං දඹ, ගල් වන, දුනු විල

(3) දියළු අවාන්, හැඩපළු ගංගා, ඩෙල්ටා, ගං කණ්ඩි

(4) නෙත්ති නෙරු, ගංගා විලෝපය, දුනු විල, හැඩපළු ගංගා

(5) ගං කණ්ඩි, පිටාරතැන්න, ගං දඹ, දහරා ඇලි (..............)

16. නිර්මාණාත්මක භූ තැටි මායිමක් දක්නට ලැබෙන්නේ පහත සඳහන් කුමන තැටි මායිම් අතර ද?

(1) පැසිපික් තැටිය - යුරේසියානු තැටිය (2) අප්‍රිකානු තැටිය - දකුණු ඇමරිකානු තැටිය

(3) පැසිපික් තැටිය - දකුණු ඇමරිකානු තැටිය (4) පැසිපික් තැටිය - උතුරු ඇමරිකානු තැටිය

(5) යුරේෂියානු තැටිය - අප්‍රිකානු තැටිය

(..............)

17. ★ වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය - $27^0$ C පමණ ය.

★ වාර්ෂික වර්ෂාපතනය - 2500 mm වඩා වැඩි ය.

★ සයරේ, බ්‍රසීලය, ඉන්දුනීසියාව වැනි රටවල පුළුල් ලෙස ව්‍යාප්ත වී ඇත.

ඉහත තොරතුරු වලට අදාළ කෙපන් ගේ උප දේශගුණ වර්ගය වන්නේ,

(1) වියළි ගිම්හාන උප නිවර්තන වර්ගය (2) පහළ අක්‍ෂාංශීය ස්ටෙප්ස් වර්ගය

(3) නිවර්තන තෙත් දේශගුණය (4) නිවර්තන තෙත් හා වියළි දේශගුණය

(5) තුන්ද්‍රා දේශගුණය (..............)

18. ශ්‍රී ලංකාවට සංවහන වැසි (අන්තර් මෝසම් වැසි) ඇතිවීම කෙරෙහි බලපාන සූර්යයාගේ පිහිටීම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) කර්කටක නිවර්තනයට සූර්යයා මුදුන් වීම (2) මකර නිවර්තනයට සූර්යයා මුදුන් වීම

(3) ග්‍රිනිච් මධ්‍ය දේශාංශයට සූර්යයා මුදුන් වීම (4) ජාත්‍යන්තර දින රේඛාවට සූර්යයා මුදුන් වීම

(5) සමකය ආශ්‍රිත කලාපයට සූර්යයා මුදුන් වීම (..............)

19. ඕසෝන් ස්ථරය රැකගැනීමේ ජාත්‍යන්තර දිනය වන්නේ,

(1) මාර්තු 22 (2) පෙබරවාරි 2 (3) මැයි 22

(4) සැප්තැම්බර් 16 (5) ඔක්තෝම්බර් 16 (..............)

Education NCP - www.edncp.lk

20. මානුෂ භූගෝල විද්‍යාවේ පදනම දැක්වෙන නිවැරදි ව පිළිතුර වන්නේ,

(1) භූ ලක්ෂණ දෘශ්‍ය මාධ්‍යයෙන් සහ දත්ත වගු වලින් අධ්‍යයනය කිරීමයි.

(2) මිනිසා පිළිබඳ ව හඳාරණ විද්‍යාවයි.

(3) සංස්කෘතික පරිසරය තුළ මිනිසා හැසිරෙන ආකාරය අධ්‍යයනය කිරීමයි.

(4) මිනිසා හා භෞතික පරිසරය අතර සබඳතාව අධ්‍යයනය කිරීමයි.

(5) මිනිස් පරිසර සබඳතාව තුළින් නිර්මිත මානව කටයුතුවල අවකාශීය සංවිධානය අධ්‍යයනය කිරීමයි. (..............)

21. ලෝක ජන සංඛ්‍යාව බිලියන හත ඉක්මවනු ලැබුයේ,

(1) 2011 ඔක්තෝම්බර් 31 දින

(2) 2012 ඔක්තෝම්බර් 25 දින

(3) 2010 සැප්තැම්බර් 30 දින

(4) 2013 සැප්තැම්බර් 25 දින

(5) 2015 ඔක්තෝම්බර් 10 දින (..............)

22. ප්‍රජා විද්‍යාත්මක ක්‍රාන්තීය සංකල්පයට අනුව, වේගයෙන් පහළ බසින උපත් අනුපාතයක් සහ වේගයෙන් පහළ බසින මරණ අනුපාතයක් අනුපිළිවෙළින් දක්නට ඇත්තේ කවර පිළිතුරේ ද?

(1) පහළ ස්ථාවර අදියර සහ පසු ප්‍රසාරණ අදියර

(2) මුල් ප්‍රසාරණ අදියර සහ පසු ප්‍රසාරණ අදියර


(3) පහළ ස්ථාවර අදියර සහ ඉහළ ස්ථාවර අදියර

(4) පසු ප්‍රසාරණ අදියර සහ ඉහළ ස්ථාවර අදියර

(5) පසු ප්‍රසාරණ අදියර සහ මුල් ප්‍රසාරණ අදියර

(..............)

23. ලෝකයේ රටවල් අතරින් පහත දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩවලට අදාළ රටවල් කාණ්ඩය වන්නේ,



(1) ස්පාඤ්ඤය, චීනය, ජපානය

(2) ඉතියෝපියාව, එක්සත් රාජ්‍ය, හංගේරියාව

(3) ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව

(4) ඕස්ට්‍රේලියාව, සෝමාලියාව, ඉන්දුනීසියාව

(5) ජපානය, මැලේසියාව, ඉන්දියාව (..............)

24. ලංකාවේ ජන සංයුතියට අනුව 2001 වර්ෂයේ සිටි සිංහල ජන ප්‍රතිශතය වන්නේ,

(1) 81.9% (2) 14.3% (3) 67.5%

(4) 76.7% (5) 89.26% (..............)

Education NCP - www.edncp.lk


25. ලෝකයේ වැඩිම පිරිසක් භාවිත කරනු ලබන භාෂාව වන්නේ,

(1) ඉංග්‍රීසි භාෂාව (2) ප්‍රංශ භාෂාව (3) මැන්ඩරින් භාෂාව

(4) රුසියන් භාෂාව (5) අරාබි භාෂාව

(..............)

26. I II III



ඉහත දක්වා ඇති ජනාවාස රටාව අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) ආකීර්ණ, පොකුරු, රේඛීය (2) රේඛීය, පොකුරු, ආකීර්ණ

(3) ආකීර්ණ, රේඛීය, විකීර්ණ (4) න්‍යෂ්ටික, රේඛීය, පොකුරු

(5) විකීර්ණ, රේඛීය, ආකීර්ණ (..............)

27. ජන සංඛ්‍යාවේ විශාලත්වය අතරින් ඉදිරියෙන් ම සිටින රටවල් කාණ්ඩය පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) චීනය, බ්‍රසීලය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය

(2) ඉන්දියාව, චීනය, බ්‍රසීලය, ඇමරිකා එක්සත් ජනපදය

(3) ඉන්දියාව, චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දුනීසියාව

(4) චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දුනීසියාව

(5) චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඇමරිකා එක්සත් ජනපදය (..............)

28. ශ්‍රී ලංකාවේ අඩුම හා වැඩිම ජන සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්ක අනුපිළිවෙළින් දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?

(1) මුලතිව්, කොළඹ (2) කොළඹ, පොලොන්නරුව (3) කොළඹ, යාපනය

(4) මුලතිව්, යාපනය (5) මුලතිව්, ගම්පහ (..............)

29. ලෝක නාගරික සාමූහිතයකට උදාහරණයක් වන්නේ,

(1) බොෂ් වොෂ් ය. (2) චිපිට්ස් ය. (3) බර්මින්හැම් ය.

(4) ටොකයිඩෝ ය. (5) මොස්කව් ය. (..............)

30. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජන ඝනත්වය වර්ග කිලෝමීටර එකට,

(1) 245 (2) 386 (3) 299

(4) 367 (5) 583 (..............)



Education NCP - www.edncp.lk

## II කොටස

**සැලකිය යුතුයි :**

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ 02, 03 ප්‍රශ්නවලින් එක් කොටසක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1 : 50 000 පරිමාණයේ රත්නපුර සිතියම් කොටසක් ඔබට සපයා ඇත. මෙහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 100 කි. මෙම සිතියම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පහත A, B, C, D අක්ෂරවලින් දැක්වෙන භෞතික ලක්ෂණ හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)

(ii) සිතියම්ගත ප්‍රදේශයෙන් හඳුනාගත හැකි භූමි පරිභෝග වර්ග හතරක් සහ ස්වාභාවික වෘක්ෂලතා වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 1/2 × 6 = 3)

(iii) සිතියම්ගත ප්‍රදේශයේ ජන ඝනත්වය අඩුවීමක් දැකිය හැක. ඒ සඳහා බලපා ඇති හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

(iv) සිතියම්ගත ප්‍රදේශයේ මාර්ග රටාව නිර්මාණය වීමේ දී කෙතරම් දුරට භෞතික භූ දර්ශනය පදනම් වී ඇත්දැයි සිතියමෙන් උපුටාගත් කටු සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) (අ) අංක 01 චතුරස්‍රය පරිමාණයෙන් දෙගුණයක් වන සේ විශාල කර ඇඳ නව රේඛීය පරිමාණ සටහන දක්වන්න. (ලකුණු 03)

(ආ) චතුරස්‍රය තුළ ඇතිවන වැස්ම ඉවත් කළහොත් සිදුවිය හැකි ප්‍රතිඵලයක් ලියන්න. (ලකුණු 01)

02. (i) නවීන සිතියම් විද්‍යාව යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) භූගෝලීය තොරතුරු පද්ධති හා සම්ප්‍රදායික සිතියම් විද්‍යාත්මක ක්‍රම අතර පවත්නා සමානකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) භූගෝලීය තොරතුරු පද්ධතියක වැදගත්කම වර්ධනය වීම කෙරෙහි බලපා ඇති සාධක 03 ක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) භූගෝලීය තොරතුරු පද්ධති ආශ්‍රිත ප්‍රධාන භාවිත තුනක් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(v) දුරස්ථ සංවේදන මූලාශ්‍ර සිතියම් නිර්මාණය සඳහා භාවිතා කිරීමේ දී ලැබෙන වාසි දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

Education NCP - www.edncp.lk

03. පහත සඳහන් වගුවෙන් දැක්වෙන්නේ 1981 හා 1998 වර්ෂ තුළ ශ්‍රී ලංකාවේ රසායනික පොහොර භාවිතය (බෝග අනුව - මෙට්‍රික් ටොන්) පිළිබඳ දත්තයන් ය.

| **බෝගය** | **1981** | **1998** |
|---|---|---|
| වී | 155 000 | 315 000 |
| තේ | 103 000 | 166 000 |
| රබර් | 16 000 | 11 000 |
| පොල් | 37 000 | 42 000 |
| ක්ෂේත්‍ර බෝග | 14 000 | 41 000 |
| අපනයන බෝග | 3 000 | 9 000 |
| වෙනත් | 34 000 | 28 000 |

**මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තා 1982 සහ 1999**

(i) මෙම දත්ත උපයෝගී කරගෙන ද්විත්ව තීරු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ලකුණු 10)

(ii) ඉහත සඳහන් රසායනික පොහොර භාවිතය පිළිබඳ ව 1981 - 1998 කාලය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ප්‍රස්තාරය ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) පහත තොරතුරු නිරූපණය කිරීම සඳහා වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ගය හෝ වර්ග නම් කරන්න.

(අ) ජන සංඛ්‍යාවක වයස් හා පුමිතිරි අනුපාතය

(ආ) ත්‍රිකුණාමලයේ 2010 වර්ෂයේ මාසික වර්ෂාපතනය

(ඇ) ශ්‍රී ලංකාවේ කෘෂි අපනයනවල සංයුතිය

(ඉ) කොළඹ දිස්ත්‍රික්කයට සිදු වූ අභ්‍යන්තර ජන සංක්‍රමණ

(ඊ) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය (ලකුණු 05)

***

Education NCP - www.edncp.lk